# “සොබාදහමෙන් පිළියම් “

# අන්තර්ජාතික ජෛවවිවිධත්ව දිනය - 2020 මැයි 22

අතීතයේ ජීවත් වූ මිනිසා සරල දිවිපැවැත්ම තුලින් පරිසරය හා අනුගතවෙමින් හැකි සෑමවිටම පරිසරයට වටිනාකමක් එකතු කරමින් හා ලයාන්විතව බැඳුණු සමාජ වටපිටාවක් තුල තම දිවි පැවැත්ම සරුසාර කර ගන්නා ලදී. එහෙත් කාර්මිකරණයෙන් පසුව උදාවූ යුගයන්හිදී  සරල දිවි පැවැත්මෙන් මිදුණු මානවයා ගේ අවශ්‍යතා ද වඩාත් පුළුල්වීම හේතුවෙන් ලාභය හා පහසුව උදෙසා මුළුමහත්  පරිසරයම ආක්‍රමණය කරන ලදී. එහි ප්‍රතිඵලයන් නූතන මානවයා විසින් අත්විඳිනු ලබන්නේ ද නොසිතූ අයුරිනි.



භූමි පරිභෝජනය අධිකව සිදුකිරීම හේතුවෙන්, ජීවීන්ගේ වාසභූමි වේගයෙන් ඔවුනට අහිමි වී යමින් පවතී. වන වැස්ම ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම ජෛවවිවිධත්වයේ පැවැත්මට වැදගත්වන්නා වූ සාධකයකි. තවද ලෝකයේ බහුතරයක් රටවල මේ වන විටත් වන වැස්ම තිබිය යුතු අවම ප්‍රමාණයෙන් පවා ගිලීහි ගොස් ඇත. එමෙන්ම ලොව බලවත් රාජ්‍යයන් ඇතුළු සියලු දියුණු වෙමින් පවතින රටවල් අධික ලෙස ඉන්ධන පරිභෝජනය කිරීම, කර්මාන්ත හා කෘෂිකර්මාන්තය ඇතුළු සියලු නිෂ්පාදනයන් තුළදී රසායනික ද්‍රව්‍ය අධික ලෙස භාවිතා කරනු ලබයි. එබැවින් එහි අතුරුඵලයක් ලෙසින් පරිසරයට මුදාහරිනු ලබන රසායනික සංයෝග හේතුවෙන් ගෝලීය උණුසුම දිනෙන් දින වැඩි වී ඇත. මේ හේතුවෙන් ධ්‍රැව ආශ්‍රිත ප්‍රදේශයන්හි හිම කඳු ක්‍රමයෙන් දියවීමට පටන්ගෙන ඇත. මෙසේ හිම කඳු දියවීම හේතුවෙන් හිම කඳු යට නිදන් ගතව ඇති වසර විසි-තිස් දහස් ගණන් ඉපැරණි හා මෙතෙක් හඳුනා නොගත් බැක්ටීරියා වෛරස වැනි ක්ෂුද්‍රජීවීන් ලොව පුරා ව්‍යාප්ත වුවහොත් සිදුවිය හැකි හානිය තක්සේරු කළ නොහැකි වේ. හිම කඳු දියවීම හේතුවෙන් සාගර ජල මට්ටම ඉහළ යාමත්, සමුද්‍ර බාදනය නිසා මුහුදු කොරල්, මුහුදු තෘණ හා ඒ ආශ්‍රිත ජීවීන්ට සිදුවන හානිය ඉමහත්ය. ඉවුරු දෙපස පරිසර පද්ධතීන් විනාශ කිරීම හේතුවෙන් ගංහා පත්ල ඉස්සීම හා ඇළ දොළ ගංහා ඉවුරු බාදනය වීම හේතුවෙන් ජලජ ජීවීන් මෙන් ජලාශ්‍රිත ජීවීන්ගේ වාසභූමි  විනාශවීම, රසායනික ද්‍රව්‍ය භෞමික හා ජලජ පරිසරයට එක්වීම මගින් ජීවීන්ගේ පැවැත්මට හානි සිදුවේ. උදාහරණ ලෙස පරිසරයට එක්වන රසායන ද්‍රව්‍ය හේතුවෙන් පක්ෂීන්ගේ බිත්තර කවච තුනීවීම මගින් මියගිය පැටවුන් බිහිවීම සිදුවේ. මෙමගින් පක්ෂීන් ගහනය ක්‍රමක්‍රමයෙන් අඩුවීම සිදුවේ. අධිකව සිදුවන රසායනික භාවිතය නිසා පරාගවාහකයින්ගේ පැවැත්මට බරපතල තර්ජන ඇති වී ඇති අතර මෙමගින් කෘෂි භෝග පරාගණය බිඳවැටීම නිසා සමස්ත ආහාර නිෂ්පාදනයට බලපෑම් ඇතිකර ඇත. ජෛවවිවිධත්වයේ පවතින ආහාර දාම හා ආහාර ජාල රටාව බිඳවැටීමෙන් ජීවීන්ගේ ආහාර පිරමීඩය අක්‍රමවත්වීම සිදුවේ. තවද ආක්‍රමණකාරී ජීවීන් ප්‍රමාණය ඉහළයාම මගින් ජෛවවිවිධත්වයට වන බලපෑම් ඉහළ ගොස් ඇත. මෙම හේතු මත පරිසර සමතුලිතතාවය බිඳවැටෙයි. මෙකී අහිතකර තත්ත්වයන් ජෛව පද්ධතිය තුළ ඇති කිරීමට බලපෑ ප්‍රධානම නියමුවා වූයේ මානවයායි.

එහෙත් මානවයා නොසිතූ පරිදි අද වන විට ඉතාම කෙටි කාලසීමාවක් තුළ මුළුමහත් ලෝක ප්‍රජාවම වික්ෂිප්තභාවයට පත්කරමින් ලෝකයේ රටවල් 200කට වඩා වැඩි ප්‍රමාණයක  මිනිසුන් ලක්ෂ 45කට වැඩි ප්‍රමාණයක් ආසාධිතයින් බවට පත් කරමින් හා සමූහ මිනී වළවල් තුල මිහිදන් කරමින් ලක්ෂ

තුනකට අධික සංඛ්‍යාවක් මරණයට පත් කරනු ලැබූ කොවිඩ්- 19 වසංගතය තවමත් අපට මර්දනය කළ නොහැකි තත්ත්වයක ඇත. තාක්ෂණික මෙවලම් හා ලෝක ආරක්ෂාව උදෙසා රසායනික අවි ඇසුරු කරමින් හා න්‍යෂ්ටික අත්හදා බැලීම් සිදුකරනු ලබන සමස්ත ලෝක ප්‍රජාවම නිරුත්තර කළ හා නිමේෂයකින් ලොවම නිහඬ කරවීමට එම ක්ෂුද්‍ර ජීවියා සමත්වී ඇත.

මෙවැනිම ක්ෂුද්‍රජීවියකු මගින් මීට වසර 90 කට ඉහතදී ද මානවයා දඬුවම් ලබා ඇත. ඉදිරි අනාගතයේදී ද මෙවැනිම ආගන්තුකයින් නොසිතූ මොහොතක අප වෙත ආ හැකිය. ඔවුන් මුළු ජෛව පද්ධතියම වනසා මෙයට වඩා දරුණු ලෙසින් අපට දඬුවම් ලබා දෙනු ඇත. එබැවින් සොබාදහම දෙන දඬුවම් තුළින් අප පාඩම් රැසක් උගත යුතුය.

අද වනවිට උසස් විඥාණයකට හිමිකම් කී මානවයා කොවිඩ්-19 වසංගතයට ගොදුරු වී ඇත්තේ ජෛව ප්‍රජාවේ අනෙක් සියලු ජීවී ප්‍රජාවන් සුරැකිමින්ය. එය සැබැවින්ම ජෛවගෝලයේ වාසනාවකි. එනමුත් මිනිසා එක් මොහොතකදී විශ්වය තුළ නිහඬ කළ කොවිඩ්-19 තුළින් ලොවට පෙන්වා දුන් ධනාත්මක කරුණු රැසක් ඇති බවද අප අමතක නොකළ යුතුය. නව අරුතකින් පරිසරය දෙස බැලීමටත් පරිසරය ගැන සිතීමටත් අප යොමුවීම මගින් ජෛවවිවිධත්වය සංරක්ෂණය, තිරසාර භාවිතය හා ජාන සම්පත් භාවිතය තුලින් ලැබෙන ප්‍රතිලාභ සංරක්ෂණය හා යුක්ති සහගත ලෙස බෙදා හදා ගැනීමට මෙය ඉතාම කාලෝචිත අවස්ථාවකි.

පෘථිවියේ ආරක්ෂාවට ඇති ඕසෝන් වියන මගින් හිරුගේ සිට පෘථිවියට පතිතවන විවිධ ශක්තීන්ගෙන් යුත් විකිරණ අතරින් පෘථිවියේ ජීවීන්ට අහිතකර වන පාරජම්බුල විකිරණ (UV rays) පෘථිවිය මතට පතිතවීම වලක්වන බව අපි දනිමු . මෙම වියන මත සිදුරක් සෑදී ඇති බවටත් එමගින් අහිතකර විකිරණ පොළව මතුපිටට පැමිණෙන බවත්, ඒ හේතුකොටගෙන විවිධ සමේ පිළිකා ඇසේ සුද ඇතිවීම ඇතුළු විවිධ රෝගාබාධ ඇතිවන බවටත් විද්‍යාත්මක මත ප්‍රකාශයට පත්වී තිබුණි. එවන් අවධියක මාස තුනක් වැනි කෙටි කලකදී පෘථිවියේ මිනිස් ක්‍රියාකාරකම් පාලනයවීම වර්තමාන වසංගත රෝගයත් සමඟින් පරිසර දූෂණ ප්‍රමාණය අවම විය. උදාහරණයක් ලෙස ඉන්ධන දහනය අවමවීම ආදී හේතූන් මත හරිතාගාර වායු පිටවීම අවමවීමේ යහපත් ප්‍රතිඵලයක් ලෙසින් ඕසෝන් වියනේ පැවති විවරය වැසී යෑමේ වේගවත් ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. එයම අනාගතයේ පරිසර දූෂණය වළක්වා ගතයුතු බව ලොවටම කියාදේ. එය එසේ නොවුණිනම් නොබෝ කලකින් එක් හිරු උදාවකින් මිහිතලයේ ජීවීන් විශාල ප්‍රමාණයක් මියැදීමට පවා ඉඩ තිබුණි. සංකීර්ණ අවශ්‍යතා ඔස්සේ ලුහුබඳින මිනිසාට සොබාදහම ගැන සිතීමට කාලයක් නොමැත්තාසේය. එබැවින් සොබාදහම විසින්ම සොබාදහම සුරැකීමට ගත් විකල්ප ක්‍රමවේදයක් ලෙස කොවිඩ්-19 පිළිබඳව විටකදී සිතෙයි.

මිනිසා සියලු ජීවීන් කෙරෙහි ගෞරවය දැක්වීමට මේ සුදුසුම කාලයයි. අසීමිත ලෙස මාංශ භක්ෂණයට යොමු වූ මානවයා විසින් අනෙක් සතුන්ට මිහිතලය මත ජීවත්වීමට ඇති අයිතිය උදුරාගෙන ඇත. විවිධ වූ සත්ත්ව විශේෂයන් විවිධාකාරයෙන් පිළියෙල කරමින් මාංශ භක්ෂණය සිදුකරන රටවල මිනිසුන් බහුතරයක් මෙම රෝගයට ගොදුරුවීමද කැපීපෙනෙන ලක්ෂණයක් විය. එසේම තමා බිහිවූ මිහිතලය සුරැකීම හා එහි සංරක්ෂණය පසෙකලා පෘථිවියෙන් එහා ලොවක් පිළිබඳවද තාරකා ගැනද මිනිසුන් දිවා රාත්‍රී වෙහෙස නොබලා අධික වියදම් දරමින් වෙහෙසෙනු දැකිය හැකියි. බල අරගල, යුධ මානසිකත්වයන් තුළ සන්තාපය හා ත්‍රාසයෙන් දිවි ගෙවන මානවයාට එවැනි ආකල්ප වලින් මිදී මිහිතලය ආරක්ෂා කරමින් ජීවත්වීමේ වැදගත්කම පිළිබඳ අවධානය යොමුකළ යුතු බවට අනතුරු ඇඟවීමක් සිදුකර තිබේ .

මීට වසර 28කට පෙර 1992 රියෝද ජැනෙයිරෝ නුවර පවත්වන්නට යෙදුණු මිහිතල සමුළුවේදී ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීමේ වැදගත්කම ලෝක බලවතුන්ගේ දැඩි අවධානයට යොමුවිය. එහි ප්‍රතිඵලයක් ලෙසින් ජෛවවිවිධත්වය සංරක්ෂණය, තිරසාර ලෙස භාවිතා කිරීම හා ජාන සම්පත් වෙත ප්‍රවේශය හා ඉන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ හා යුක්ති සහගත ලෙස බෙදීම යන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අන්තර්ජාතික ජෛවවිවිධත්ව සම්මුතිය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකාවද 1992 වසරේ එම සම්මුතියටය අත්සන් තැබූ අතර 1993 වසරේ දෙසැම්බර් 29 දින සිට බලාත්මක විය. එතැන් පටන් මෙම සම්මුතියට අත්සන් තැබූ සියලු පාර්ශවකාර රටවල් එක්ව ඉහත අරමුණු කරා ළඟාවීමට ජාතික මට්ටමින් විවිධ ප්‍රතිපත්ති, උපායමාර්ග හා සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතර අන්තර්ජාතික ජෛවවිවිධත්ව දිනය ලෙසින් සෑම වසරකම මැයි 22 දින නම් කර

කාලෝචිත විවිධ තේමා පාඨයන් ඔස්සේ ලොව පුරා ප්‍රජාව ජෛවවිවිධත්වය සංරක්ෂණයට නැඹුරු කරවීමට උත්සහ දරමින් සිටියි. මෙහිදී සියලුම මානවයන් ජෛවවිවිධත්වයේ වටිනාකම පිළිබඳව හා ඉන් අපගේ ගැටළුවලට ලබාදෙන සාධාරණ පිළියම් පිළිබඳවද අවධානය යොමු කරන ලදී. මෙවර අන්තර්ජාතික ජෛවවිවිධත්ව දින තේමාව ලෙස **"Our Solutions are in Nature"** යන්න එක්සත් ජාතීන්ගේ ජෛවවිවිධත්ව සම්මුති ලේකම් කාර්යාලය විසින් හඳුන්වාදී ඇත. එය අප සිංහලට **"සොබාදහමෙන් පිළියම්** " ලෙස යොදා ගනිමු.

මිහිතලයේ උපන් මානවයා සුබවාදී ලෙසට ලෝකය දෙස බලමින්, මානව නිදහසේ සීමාව හඳුනා ගනිමින් හා ජෛවවිවිධත්වය තුල හමුවන සියලු ප්‍රාණීන්ට ගෞරවය දක්වමින් ජීවත්වීමට සිතට ගතයුතු වසර ලෙසද 2020 වසර හැඳින්විය හැකිය. මන්ද මෙතෙක් පැමිණි ගමන් මඟ තුල අප අතින් සොබාදහමට ඩොලර් වලින් තක්සේරු කළ නොහැකි තරමට අසාධාරණයන් සිදුකර ඇති බව පෙනේ.

ඒ සඳහා මූලික පියවරක් ලෙස සොබාදහමේ ජෛවවිවිධත්වය තුල අපගේ ගැටළුවට ලබාදෙන පිළියම් පිළිබඳව සොයා බලමු. ජෛවවිවිධත්වය තුල ඖෂධ ලෙස නිරෝගී දිවියකට වැදගත්වන ආහාර බෝග රාශියකි, වසංගත හා අසාත්මික රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ඇති ප්‍රතිඔක්සිකාරක ආහාර රැසක් ද ඇත. මෙකී පුළුල් ජෛවවිවිධත්වය තුළ දැකිය හැකි විවිධ රසයන්, විවිධ සුවඳ, ගුණයන්ගෙන් සැදී පැහැදුණු බවභෝග තුලින් අපට ලබාදෙන වටිනා රෝග නිවාරණ හා සෞඛ්‍ය සම්පන්න දිවියකට ලබාදෙන අනුබලයන් පිළිබඳව සොයාබැලීමට හා ඒ සඳහා ජනතාව නැඹුරු කරවීම මගින් කෘත්‍රිම ඖෂධ සඳහා යන වියදම් හා ඒවා නිෂ්පාදනයේදී ඇතිවන අහිතකර අතුරුඵල වළක්වා ගතහැකිය. මෙය ඉදිරි වසංගත තත්ත්වයන් සඳහා මානවයා ශාරීරික වශයෙන් සූදානම් කිරීමක් ද වේ. ශ්‍රී ලංකාවේ පවතින ඌනභාවිත පළතුරු රැසක ප්‍රතිඔක්සිකාරක ගුණය ඇත. අප දේශයෙන් හඳුනාගන්නා ලද එම ඌන භාවිත පලතුරු පිළිබඳ ලෝක ජනතාව දැනුවත් කල යුතුය. බෙලි, වෙරළු, නෙල්ලි, දෙළුම්, ඇඹිල්ල, හිඹුටු උගුරැස්ස ඇඹරැල්ලා වැනි පලතුරු ව්‍යාප්ත කරවීම හා ඒ සඳහා වෙළඳපොළ සකසා දියයුතුව ඇත. එසේම විෂ නාශක ගුණ හා බෝවන රෝග මර්දනයට හේතුවන ඇතැම් ශාක විශේෂ වන කොහොඹ, අඹ හා පැඟිරි කුලයේ ශාක පිළිබඳ අවධානය යොමුකර ප්‍රජාව වෙත අවබෝධය ලබාදීම සිදුකළ හැකිය.

තවද එක් එක් රටවල පවත්නා පාරම්පරික දැනුම සංරක්ෂණය කිරීම තුළින් ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීමට දායකත්වයක් ලබාගත හැකිය. පාරම්පරිකව පැවත ආ දේශිය සහල් මා වී, සුවඳැල්, කළුහීනටි වැනි විශේෂයන් ලොවට හඳුන්වාදීමද, කෘත්‍රිම ආහාරවලින් වැලැකී සිටීමේ වටිනාකම හෙළ වෙදකම ඔස්සේ අවබෝධකරලීම හා ඒ සඳහා ජෛවවිවිධත්වය තුළින් ලබාගතහැකි උපයෝගීතාවයන් පෙන්වාදීම සිදුකළ හැකිය.

ජෛවවිවිධත්වය සුරැකීම උදෙසා අතීතයේ සිටම ශ්‍රී ලාංකිකයන් රැකගත් සිරිත් විරිත් වන තම ගෙවත්තේ බවභෝග නෙළිමේදී අස්වනු කොටසක් සතුන් උදෙසා වගාවෙන් ඉතිරි කිරීම තුළින් අනෙක් සත්ත්වයින්ගේ පැවැත්මට උදව් කිරීම වැනි වටිනා ඥාණයන් පිළිබඳ අවබෝධ කරලීම වැදගත්වේ. එය වනසතුන් හා පරාගකාරවාහකයින්ගේ පැවැත්මට වැදගත්වේ. එමෙන්ම පැරණි සමාජයේ බොර පැහැති ජලය පිරිසිදු කිරීම සඳහා ඉඟිනි ඇට දැමීම තුළින් ජලය පිරිසිදු වන්නාසේම එම පරිසරයේ වෙසෙන ජීවී ප්‍රජාවන්ටද රසායනික ද්‍රව්‍ය වලින් අතමිදීමෙන් ජීවිතය ආරක්ෂා කර ගැනීමට අවස්ථාව සැලසුණි. එවැනි ක්‍රමවේද කුඩා වැව් පද්ධති තුලට හඳුන්වාදීම තුළින් පාරම්පරික දැනුම ලොවට දායාද කළ හැකිය. මන්ද අන්තර්ජාතික ජෛවවිවිධත්ව සම්මුතියේ 8 ජේ වගන්තිය මගින් පාරම්පරික දැනුම සංරක්ෂණයට අනුබල දී ඇත. එබැවින් ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා පාරම්පරික දැනුමේ දායකත්වය වැදගත්වන බවද ප්‍රත්‍යක්ෂ කරයි. කෘමිනාශක වෙනුවට පළිබෝධකයින් පළවා හැරීම සඳහා භාවිතාවන පාරම්පරික කෙම් ක්‍රම යම් තරමින් හෝ ගෙවතු වගාවන් සඳහා උපයෝගීකර ගැනීමට ද කාබනික පොහොර භාවිතයට නැඹුරු කරවීම වැනි ක්‍රමවේද පිළිබඳ ජනතාව දැනුවත් කිරීම තුළින් රසායනික ක්‍රමවේද ඔස්සේ ලුහුබඳින අපව, පරිසර හිතකාමී පුරවැසියන් බවට යොමුකරවිය හැකිය.පරිසර දූෂණය අවම වනලෙස හිරුගේ කිරණ ශක්ති උපයෝගිතාවයට ජනතාව යොමු කරවීම තුළින් ඉන්ධන දැවීමෙන් සිදුවන අහිතකර බලපෑම් අවම කරගත හැකිවේ.



ඖෂදීය හෙළ ඔසු ශාක වන රණවරා, සුදුහඳුන්, ඇත්දෙමට, බුළු, මූණමල්, ඇහැළ, ගම්මාලු, අත්තික්කා, එරබදු, මගුල් කරඳ, ඇඹුල් දොඩම් වැනි ශාක විශේෂවල වටිනාකම පිළිබඳ ලෝක ජනතාවට හෙළ වෙදකම ඔස්සේ දැනුවත් කිරීමද වටිනා මෙහෙවරක් වනු ඇත. වසංගත රෝග ඇතුළු අසාත්මික රෝගයන් පිටුදැකීම සඳහා ශරීරයට විටමින් හා පෝෂණ සංඝටක වැදගත් වන බව අපි දනිමු. එම සංඝටක ඌනතාවයන්ද මෙවැනි රෝගවලට ගොදුරුවීමට වැඩි ඉඩක් ලැබෙන බැවින් විටමින් ඩී වැනි මූලද්‍රව්‍ය ස්වභාවිකව ලැබෙන උදා හිරුඑළිය ජෛවගෝලය තුළ සුපිරිසුදු ලෙසින් ලබාගැනීමට හැකිවන ලෙස යහපත් පරිසරයක් පවත්වා ගැනීමට සියලු පුරවැසියෝ මෙහෙයවීම සඳහා මෙය අවස්ථාවක් කර ගැනීම වටී. ඒ තුළින්ද ශාක හා සත්ත්ව ප්‍රජාවන්ගේ යහපැවැත්ම තහවුරු කරනු ඇත.

සොබාදහමේ දඬුවමක් ලෙසින් අප අත්විඳින කොවිඩ්-19 වසංගතය තුළින් අළුත් ඇසකින් ලොව දෙස බැලීමටත් සියලු ආගමික ශාස්තෘන් වහන්සේලා දේශනා කර ඇති පරිදි, එකිනෙකා කෙරෙහි ආදරය, කරුණාව දැක්වීමටත් මිහිතලයේ ඇතිවූ සියලු ස්වභාවික වස්තූන් කෙරෙහි ගෞරවය දැක්වීමටත් මනුෂ්‍යයා විසින් අදිටන්කර ගතහොත් 2020 මැයි 22 වන දින සමරනු ලබන අන්තර්ජාතික ජෛවවිවිධත්ව දිනයේ තේමා පාඨයෙන් ගම්‍යවන ලෙසින් මිනිසාට වාසය සඳහා වෙනත් ග්‍රහලෝක වෙත පියඹායෑම අනවශ්‍යය. අපගේ සොබාදහම තුළින්ම සමස්ත ජෛව ප්‍රජාවම සුරක්ෂිත කරනු ඇත. එය හඳුනාගැනීම අප සැමගේම පරම යුතුකමක් හා වගකීමකි.



මිහිතලයේ පවතින ජෛවවිවිධත්වය කෙරෙහි ගෞරවය දැක්වීමට අප අව්‍යාජ ලෙසින් උත්සුක වුවහොත් සොබාදහම විසින්ද අප රකිනු ඇත.

ඩී.මනෝජා ජයසේකර , වැඩසටහන් සහකාර (පරිසර)
ජෛවවිවිධත්ව අංශය
පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

මඟ පෙන්වීම - ආර්.එච්.එම්.පී. අබේකෝන්, අධ්‍යක්ෂ, ජෛවවිවිධත්ව අංශය
රූපිකා බක්මීදෙනිය, සහකාර අධ්‍යක්ෂ, ජෛවවිවිධත්ව අංශය
සිතුවම් - ලතිකා හපුආරච්චි, සහකාර අධ්‍යක්ෂ, වන සම්පත් අංශය